## ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2015

-----------------------------------------------

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

වර්ෂය තුල වූ මූල්‍ය චලනයන් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අනාවරණය වූ පහත දූර්වලතා අනුව එහි නිවැරදිතාවය හා තුල්‍යතාවය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(i) සමාලෝචිත වර්ෂයට අදාල රු.1,991,772 ක ක්ෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.761,585 ක් ලෙස දක්වා තිබුණි.

(ii) මූල්‍ය චලනයට බලපෑමක් නොවූ සම්පූර්ණයෙන් ක්ෂය කරනලද පිරිවැය රු.720,000 ක්වූ පරිගණක මෘදුකාංග ඉවත් කිරීම මුදල් ලැබීමක් ලෙස දක්වා තිබුණි.

(iii) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පෙර වර්ෂ ගැලපීමක් ලෙස දක්වා ඇති රු.510,187 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගලපා නොතිබුණි.

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් නොවන සංචලනයන් ලෙස එකතු කළයුතු පාරිතෝෂිත වෙන් කිරීම් රු.960,032ක වටිනාකම මූල්‍ය කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

ඉකුත් වර්ෂයේ දේපල පිරියත හා උපකරණ පිරිවැය හා සමුච්චිත ක්ෂය වෙන් කිරීමේ ශේෂ අතර රු.510,188 ක වෙනසක් නිරූපණය වුවද එය හඳුනාගෙන අදාල ගිණුම්වල නිවැරදි කිරීම සිදුකිරීම වෙනුවට පූර්ව වර්ෂ ගැලපීම් ලෙස සමාලෝචිත වර්ෂයේ වියදම් වලින් අඩුකර දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නෛතික ප්‍රාග්ධනිත අයිතියක් නොමැතිව කාර්යාංශයේ පරිපාලන කාර්යාලය පවත්වාගෙන යන හෝටල් කළමනාකරණ ආයතනයට අයත් ගොඩනැගිලි පරිශ්‍රය අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් 2014 වර්ෂයේදී දරන ලද රු.2,020,565 ක වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගොඩනැගිලි ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.1,565,003 ක් වූ ඉතිරි ප්‍රවර්ධන අයිතම තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.834,380 ක ස්ථාවර තැන්පතු පොළී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

-----------------------------

දීර්ඝ කාලීන ආයෝජන ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු.25,300,000 ක් වුවද බැංකු වාර්තා අනුව එම ශේෂය රු.26,549,988 ක් විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------

පිරිවැය රු.6,390,785 ක් වූ දේපල, පිරියත හා උපකරණ වලට අදාල ස්ථාවර වත්කම් ලේඛනය හා ප්‍රධාන ජ්නලයේ දක්වා තිබූ වටිනාකම රු.49,758,863 කට අදාල ජ්නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු ගිණුම්**

----------------

2011 වර්ෂයේ සිට ලැබිය යුතු එකතු කල අගය මත බදු (VAT) ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු.450,554 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති රීති,රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 257 | නියැදි විගණන පරීක්ෂාවට අනුව අවස්ථා 05කට අදාළ රු.105,986 ක වියදම් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 386(6) | නියැදි විගණන පරීක්ෂාවට අනුව රු.70,109 ක් වටිනා චෙක්පත් 5 ක් මාණ්ඩලික නිළධාරියෙකුගේ අනුමැතිය නොමැතිව විවෘත චෙක්පත් වශයෙන් නිකුත් කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

--------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,407,006 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.49,594,173 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.22,187,167 කින් පිරිහී තිබුණි. වෙළඳ වියදම් රු.28,294,006 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2014 වර්ෂයේ සිට ක්‍රමයෙන් පිරිහී තිබූ අතර 2014 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පිරිහීම සියයට 45 ක් විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2013 වර්ෂයේදී රු.78,260,615 ක් වූ කාර්යාංශයේ දායකත්වය ක්‍රමයෙන් පිරිහී තිබුණු අතර 2015 වර්ෂයේදී එය රු.40,355,425 ක්වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 42(2) වගන්තිය අනුව කාර්යාංශයේ අරමුණු අතුරින් පහත සඳහන් අරමුණු හා පරමාර්ථ මෙතෙක් ඉටුකරගැනීමට නොහැකිවී තිබුණි.

- ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන,රැස්වීම් සහ ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් වශයෙන් හා පොළඹවන සුළු චාරිකා ගමනාන්තයන් වශයෙන් ශ්‍රීලංකාව සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම සඳහා සැලසුම් කළ පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම.

- සම්මේලන,රැස්වීම්,ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන් වල විවිධ අංශවල නිරතව සිටින තැනැත්තන්ට සහ සංවිධානවල වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ එම ප්‍රමිති පවත්වාගැනීම බලාත්මක කිරීම;

- සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා පිළිබඳ විවිධ අංශවල කටයුතු කිරීමෙහි නියැලී සිටින විවිධ ගණවල තැනැත්තන්ගේ හෝ සංවිධානවල වෘත්තීය නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

- සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටින යම් සංගම් හෝ සංවිධාන සමග අනුබද්ධවීම, ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීම හෝ ඒ යම් සංගම් හෝ සංවිධාන සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීම;

- ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි අළෙවි කිරීම සඳහා කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම;

- සත්කාරක සේවා ඇතුලුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවා, අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ආකාරයට සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 13 ක් සඳහා රු.මිලියන 172.30 ක් වෙන්කර තිබූ නමුත් වර්ෂය තුළ වැයකර තිබුණේ රු.මිලියන 76.84 ක් පමණි.

(ඇ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව 2015 වර්ෂයේදී ව්‍යාපෘති 85 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද නිමකර තිබුණේ ව්‍යාපෘති 19 ක් පමණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 27 ක් පුරප්පාඩුව පැවති අතර ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සඳහා මුළු පිරිවැය පිළිවෙලින් රු.8,153,546 ක් සහ රු.10,956,647 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේ දී එක් සේවකයෙකු සඳහා වූ පිරිවැය පිළිවෙලින් රු.1,019,193 ක් සහ රු.1,369,581 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2015 මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 05 වන දින වූයෙන් දින 35 ක ප්‍රමාද කාලයක් නිරීක්ෂණය විය.

**5.2 සංයුක්ත සැලැස්ම**

------------------

2015-2017 කාලයට අදාළව පිළියෙල කළ සංයුක්ත සැලැස්මෙහි කාර්යාංශය මගින් ඉදිරි වර්ෂ 03 තුළදී ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක සඳහා වන අයවැය පුරෝකතනයන් ඇතුළත් කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:2 ප්‍රකාරව අවශ්‍යතාවයන්ට අනුව ආසන්න වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල හා උපායමාර්ගික සැලසුම් සමාලෝචනය කර කළමනාකරණයේ වගකීම ක්‍රියාකාරී සැලස්මෙන් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට සහ සැලසුම් කරන ලද කාලයට අදාළව ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ඉටුවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කල යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉදිරිපත් කර තිබූ අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් වර්ෂය තුළදී ලඟාකර ගත්තේද යන්න තහවුරු කර ගත හැකි ආකාරයට ප්‍රමාණාත්මක තොරතුරු ඇතුළත් කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

--------------------

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ පරීක්ෂාවට ලක්කර නොතිබුණි.

**5.5 ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 8 හි 4.2.1(ආ) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී විෂයයන් 18 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 29 සිට සියයට 306 ක් දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම්කරණ කටයුතු සිදු නොකිරීම. |
| (ආ) | මෙහෙයුම් කාලය | 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත මඟින් ප්‍රවර්ධන කාර්යභාරය සිදු නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | අයවැය හා තත්‍ය සංඛ්‍යා අතර විචලතාවයන් පැවතීම. |